# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. SPLG/GL/A/KARPS/5/23/38/M

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2024 ජූලි 08 දින

සභා ලේකම්

කරන්දෙණිය ප්‍රාදේශීය සභාව

**කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඇතුළත්ව එහි ක්‍රියාකාරීත්වය පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාර සභාව වෙත ඉදිරිපත් කරන විස්තරාත්මක කළමනාකරණ විගණකාධිපති වාර්තාව.**

---

යථෝක්ත විගණන වාර්තාව මේ සමඟ එවා ඇත.

02. ජාතික විගණන පනතේ 39(1) උප වගන්තියේ සඳහන් විධිවිධාන අනුව කටයුතු කර, මෙම වාර්තාවේ දින සිට මාස 03 ක් ඇතුළත යොජනා කරනු ලබන ප්‍රතිකර්ම, ක්‍රියාමාර්ග හෝ සැලකිල්ලට ගත් ක්‍රියාමාර්ග පිළිබඳව මා වෙත ද, පළාත් භාණ්ඩාගාරයේ ලේකම්වරයා වෙත හා අදාළ අමාත්‍යවරයාට දැනුම් දිය යුතුය.

03. පනතේ 39(2) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාවේ ඇතුළත් මා විසින් පෙන්වා දී ඇති යම් ක්‍රියාමාර්ගයක් හෝ කරුණක් පිළිබඳව ක්‍රියාත්මක කිරීමේ හෝ නොහැකි වීමේ හේතු තිබේ නම් ඒ බව ද මා වෙත දන්වා එවන මෙන් කාරුණිකව දන්වමි.

යූ.යූ.පී. පෙරේරා

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති

විගණකාධිපතිතුමා වෙනුවට

යූ. යූ. පී. පෙරේරා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

පිටපත : 01. ආණ්ඩුකාරතුමා - දකුණු පළාත.

02. පළාත් පාලන කොමසාරිස් - දකුණු පළාත.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය

தேசிய கணக்காய்வு அலுவலகம்

NATIONAL AUDIT OFFICE


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | SPLG/GL/A/KARPS/<br>5/23/38/M | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2024 ජූලි 08 දින |

සභා ලේකම්,
කරන්දෙණිය ප්‍රාදේශීය සභාව

**කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඇතුළත්ව එහි ක්‍රියාකාරිත්වය පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වන වගන්තිය ප්‍රකාර සභාව වෙත ඉදිරිපත් කරන විස්තරාත්මක කළමනාකරණ විගණකාධිපති වාර්තාව**

---

කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඇතුළත්ව එහි ක්‍රියාකාරිත්වය පිළිබඳව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ක්‍රියාත්මක කරන ලද විගණනයේ ප්‍රතිඵල විස්තරාත්මකව මෙම වාර්තාව මඟින් නිකුත් කරනු ලැබේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 39 වන වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් ගැනීමට යෝජනා කරනු ලබන පියවර මෙම වාර්තාවේ දින සිට මාස 03 ක් ඇතුළත ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් මා වෙත දැන්වීම අවශ්‍ය වේ.**

**1.3 විගණන විෂය පථය**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.




අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.4 මූල්‍ය ප්‍රකාශන

1.4.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නව / පවත්නා නිරීක්ෂණයක් ද | පාලන අවදානම් අනාවරණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලිය රු.1,112,907 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි. | නව | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය. | ඉදිරියේදී නිවැරදි කරන බව. | ලැබිය යුතු පොලිය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට මහජ්දණ්ඩ හිනගහතොට මාර්ගය තාර දැමීමේ කර්මාන්තය වෙනුවෙන් ගෙවිය යුතු කර්මාන්ත ණයහිමි ශේෂය රු.219,778 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි. | නව | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය. | ඉදිරියේදී නිවැරදි කරන බව. | ණයහිමි ශේෂයන් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට යක්කටුව ක්‍රීඩාංගනයේ අළුතින් වැට ඉදිකිරීමේ කර්මාන්තය සඳහා දරා තිබුණු රු.74,500 ක වටිනාකම ස්ථාවර වත්කම් යටතේ ප්‍රාග්ධනීත කර නොතිබුණි. | නව | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය. | ඉදිරියේදී නිවැරදි කරන බව. | ස්ථාවර වත්කම් වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | යන්ත්‍ර අළුත්වැඩියාව සඳහා මිලදී ගෙන තිබුණු රු.51,890 ක් වටිනා අමතර කොටස් ස්ථාවර වත්කම් යටතේ ප්‍රාග්ධනීත කර තිබුණි. | නව | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය. | ඉදිරියේදී නිවැරදි කරන බව. | ප්‍රාග්ධනීත කළ නොහැකි වියදම් ස්ථාවර වත්කම් වලින් ඉවත් කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු වැටුප් හා දීමනා වලට අදාළ ණයහිමි ප්‍රතිපාදන රු.19,357 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි. | නව | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය. | ඉදිරියේදී නිවැරදි කරන බව. | ගෙවිය යුතු වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | ඉකුත් වර්ෂය සඳහා ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා සඳහා ගෙවිය යුතු ණයහිමි ප්‍රතිපාදන රු.11,235 ක් අඩුවෙන් සලසා තිබීම නිසා සමුච්චිත අරමුදල රු.11,235 කින් වැඩි වී තිබුණි. | නව | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය. | 2024 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | ඉකුත් වර්ෂ ණයහිමි ප්‍රතිපාදන නිවැරදිව හඳුනාගත යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (උ) | සමාලෝචිත වර්ෂය අවසානය වන විට පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් දායක මුදලට ගෙවිය යුතු රු.12,702,185 ක ශේෂය වෙනුවෙන් ණයහිමි යටතේ ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නව | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය. | ඉදිරියේදී සලකා බැලීමට කටයුතු කරන බව. | විශ්‍රාම වැටුප් දායකය සඳහා ණයහිමි ප්‍රතිපාදන ඇති කළ යුතුය. |
| (ඌ) | සමාලෝචිත වර්ෂය අවසානයට සභාව සතු ඉඩම් 25 ක් සහ ගොඩනැගිලි 20 ක වටිනාකම හඳුනාගෙන ගිණුම් ගතකර නොතිබුණි. | නව | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය. | ඉදිරියේදී නිවැරදි කරන බව. | ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගතකල යුතුය. |
| (එ) | ඉකුත් වර්ෂයේ දී වෙනත් ආයතන සඳහා ගෙවිය යුතු රු.139,182 ක සේවක ණය ගෙවීම, සේවක ණය ගිණුමෙන් ඉවත් නොකිරීම, ජර්නල් සටහන් 17 මඟින් නිවැරදි කිරීමේ දී සමුච්චිත අරමුදලට බැර කිරීම නිසා සමුච්චිත අරමුදල රු.139,182 කින් වැඩි වී තිබුණි. | නව | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය. | අවිනිශ්චිත ගිණුමක් නොමැති බැවින් සමුච්චිත අරමුදල හරහා ගලපා ඇති බව. | ගෙවිය යුතු සේවක ණය නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ඒ) | (i) සමාලෝචිත වර්ෂය තුළ ස්ථාවර තැන්පතු වල ආයෝජනය කල රු.55,500,000 ක මුදල ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ ගෙවීම් ලෙස දැක්විය යුතු වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | නව | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය. | ඉදිරියේදී නිවැරදි කරන බව. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව සකස් කළ යුතුය. |
| | (ii) සමාලෝචිත වර්ෂයේ දී මුදලින් ලද ප්‍රාග්ධන ලැබීම් රු.17,262,900 ක් වුවද, මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ ප්‍රාග්ධන ලැබීම් රු.1,217,944 ක් ලෙස සටහන් කිරීම නිසා මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.16,044,955 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නව | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය. | ඉදිරියේදී නිවැරදි කරන බව. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව සකස් කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (iii) | සමාලෝචිත වර්ෂයේ මුදලින් දරන ලද ප්‍රාග්ධන වියදම රු.19,327,410 ක් වුවද, ආයෝජන ක්‍රියාකාරම් යටතේ ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ ප්‍රාග්ධන වියදම් රු.21,059,440 ක් ලෙස සටහන් කිරීම නිසා ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.1,732,030 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නව | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය. | ඉදිරියේදී නිවැරදි කරන බව. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව සකස් කළ යුතුය. |

### 1.4.2 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | නව / පවත්නා නිරීක්ෂණයක් ද | පාලන අවදානම් අනාවරණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 132(ච) උප වගන්තියට අනුකූල නොවන පරිදි බල ප්‍රදේශයෙන් පිටත කාර්යාලය හා නිවස අතර ගමන් කිරීම වෙනුවෙන් 2023 වර්ෂයේ දී ලේකම් විසින් භාවිතා කරන ලද ඉන්ධන වෙනුවෙන් රු.800,139 ක් ගෙවීම් කර තිබුණු අතර, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 16/2014 ට අනුකූල නොවන පරිදි කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් රහිතව දිනකට නිවස හා කාර්යාලය අතර ගමන් වාර 04 ක් සඳහා ලේකම්වරයා විසින් සභාවේ වාහනය භාවිතා කර තිබුණි. | නව | පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ. | පළාත් පාලන කොමසාරිස්ගේ ලිපිය අනුව කටයුතු කළ බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතය. |

### 1.4.3 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නව / පවත්නා නිරීක්ෂණයක් ද | පාලන අවදානම් අනාවරණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රාග්ධන ආධාර ණයගැති ශේෂය තුළ රු.226,224 ක වටිනාකමින් යුතු වර්ෂ 02 ක් ඉක්ම වූ ණයගැති ශේෂයක් ඇතුළත්ව තිබුණි. | නව | පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ. | පළාත් පාලන කොමසාරිස් වෙත ඉල්ලීම් ලිපි ඉදිරිපත් කළ ද එම මුදල් නිදහස් කර නොමැති බව. | දීර්ඝකාලීනව අය කරගත යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.4.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල<br>රු. | නොසැපයූ විගණන සාක්ෂි | නව / පවත්නා නිරීක්ෂණයක් ද | පාලන අවදානම් අනාවරණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| හිඟ හිටි වෙළඳ බලපත්‍ර | 123,350 | විස්තරාත්මක උපලේඛන | පවත්නා | පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ. | කපා හැරීමට නිර්දේශ ලැබී ඇති බව. | ගිණුම් විෂයන්වලට අදාල ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| ලැබිය යුතු පොළ බදු | 176,439 | විස්තරාත්මක උපලේඛන | පවත්නා | පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ. | ඉදිරියේදී නිවැරදි කරන බව. | ගිණුම් විෂයන්වලට අදාල ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ (ඉදිරියට ගෙන ආ ශේෂය) | 11,178,044 | උපලේඛන | පවත්නා | පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ. | විස්තරාත්මක තොරතුරු සොයා ගැනීමට නොහැකි වී ඇති බව. | ගිණුම් විෂයන්වලට අදාල ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| ලී බඩු හා සවිකිරීම් (ඉදිරියට ගෙන ආ ශේෂය) | 1,657,802 | උපලේඛන | පවත්නා | පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ. | විස්තරාත්මක තොරතුරු සොයා ගැනීමට නොහැකි වී ඇති බව. | ගිණුම් විෂයන්වලට අදාල ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

### 1.5 අනුකූල නොවීම්

### 1.5.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | **1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** | | | |
| | (i) 24 වන වගන්තිය | සභාව සතු මාර්ග ඉන්වෙන්ට්‍රිය අනුව 2020 වර්ෂය වන විට කි.මී.513.42 ක් වන මාර්ග 417 ක් | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතය. |

| | | | | |
|---|---|---|---|---|
| | | නඩත්තු කර, ලේඛනයට ඇතුළත් කර තිබුණු අතර, 2020 වර්ෂයට පසුව රු.24,893,945 ක වියදමින් ඉදිකරන ලද කි.මී.4.151 ක් වන මාර්ග 23 ක් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. | | |
| (ii) | 100 වන වගන්තිය | 2022 හා 2023 වර්ෂයන් හි සභාව වෙත ලැබී තිබූ මහජන පැමිණිලි 20 ක් සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් කටයුතු කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) | 132(ඒ) වගන්තිය | ආගමික කටයුත්තක් සඳහා එක් වර්ෂයකට රුපියල් දහසක් නොඉක්මවන පරිදි සභා අරමුදලින් ගෙවීම් කළයුතු නමුත්, ඊට අනුකුල නොවන පරිදි සභා බල ප්‍රදේශයේ පෙරහැර කටයුත්තක් සඳහා සභා අරමුදලින් ගෙවීම් සිදුකර තිබුණි. | ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| **(ආ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | | |
| (i) | මු.රෙ. 388 හා 389 | සභාව විසින් නිකුත් කරනු ලබන සියළුම චෙක්පත් පිළිබඳ විස්තර ඇතුළත් කර ලේඛනයක් නඩත්තු කළයුතු වුවත්, සභාව විසින් නිකුත් කරන ලද රු.1,498,152 ක් වටිනා චෙක්පත් 26 ක් භාරගත් පාර්ශවයන්ගේ තොරතුරු ලේඛන ගතකර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,020,062 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.56,352,864 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තුගත ආදායම | 2023 බිල් කළ ආදායම | 2023 රැස් කළ ආදායම | 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 ඇස්තමේන්තුගත ආදායම | 2022 බිල් කළ ආදායම | 2022 රැස් කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 4,168,798 | 4,741,920 | 5,108,424 | 5,620,998 | 3,578,798 | 2,955,934 | 3,219,079 | 5,987,502 |
| කුලී | 8,910,350 | 6,659,850 | 9,887,267 | 4,306,404 | 7,893,230 | 6,481,989 | 7,548,540 | 7,533,821 |
| බලපත්‍ර ගාස්තු | 450,100 | 422,597 | 398,597 | 149,350 | 400,100 | 172,935 | 172,935 | 125,350 |
| වෙනත් ආදායම් | 11,883,000 | 8,463,326 | 8,460,326 | 48,192 | 8,376,600 | 7,868,597 | 7,868,597 | 45,192 |
| | 25,412,248 | 20,287,693 | 23,854,614 | 10,124,944 | 20,248,728 | 17,479,455 | 18,809,151 | 13,691,865 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නව / පවත්නා නිරීක්ෂණ යක් ද | පාලන අවදානම් අනාවරණය | කළමනාකාරීත්ව යේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| **(අ) ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය** | | | | |
| සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට අයවියයුතු ආදායම රු.13,691,865 ක් විය. වර්ෂය තුළ බිල් කිරීම් රු.20,287,693 ක් වූ අතර, රැස් කළයුතු සමස්ථ ආදායම රු.33,979,558 ක් වුවද, වර්ෂය තුළ රැස් කරන ලද ආදායම රු.23,854,614 ක් වීමෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟය රු.10,124,944 ක් විය. | පවත්නා | පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත. | හිඟ ආදායම් රැස් කිරීමේ ප්‍රගතිය වර්ධනය කර ගත යුතුය. |

(ආ) වරිපනම් හා බදු

| | | | | | |
|---|---|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට මුළු හිඟ වරිපනම් හා බදු ආදායම රු.5,987,502 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් රු.4,741,920 ක් විය. මේ අනුව වර්ෂය තුළ අයවිය යුතු මුළු ආදායම රු.10,729,422 ක් වුවද, රැස් කළ ආදායම රු.5,108,424 ක් වීමෙන් ආදායම් රැස් කිරීමේ ප්‍රතිශතය සියයට 48 ක් හා රු.5,620,998 ක හිඟයක් පැවතුණි. | පවත්නා | පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍යා වේ. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර ඇති බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි නිශ්චල දේපල සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය තුළ ඒකක 1791 කින් රු.7,217,762 ක හිඟ ආදායමක් සභාව වෙත අය වීමට තිබූ නමුත්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. මේ තුළ 2023 වර්ෂය සඳහා කිසිදු බදු මුදලක් නොගෙවූ ඒකක 1127 ක් පැවති අතර, එම ඒකක වලින් අය වියයුතු හිඟ වරිපනම් ශේෂය රු.3,817,535 ක් විය. | නව | පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍යා වේ. | දැනුවත් කිරීම් කර හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iii) | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ග්‍රාම නිලධාරී වසම් 40 ක් පැවති අතර, ඉන් වසම් 03 කින් පමණක් වරිපනම් බදු අය කිරීමට කටයුතු කර තිබූ අතර, ඉතිරි ග්‍රාම නිලධාරී වසම් 37 කින් ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්ති ප්‍රකාරව දියුණු ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අය කිරීමට සභාව කටයුතු කර නොතිබුණි. | නව | පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍යා වේ | තක්සේරු වාර්තාව ලැබීමෙන් පසු ආදායම් අය කර ගැනීමට කටයුතු කරන බව. | දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන බදු පැනවිය යුතුය. |
| (iv) | ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයේ වරිපනම් බදු ආදායම් බිල් කිරීම 2008 වර්ෂයේ සිදු කරනු ලබන වරිපනම් තක්සේරු වටිනාකම මත වන අතර දේපලවල වර්තමාන වටිනාකම් තක්සේරු කර ආදායම අය නොකිරීමෙන් සභාවට ආදායමක් අහිමි වන බව දක්නට ලැබුණි. | පවත්නා | පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍යා වේ | තක්සේරු වාර්තාව ලද වහාම ආදායම් අය කර ගැනීමට කටයුතු කරන බව. | වර්තමාන වටිනාකම් තක්සේරු කර ආදායම් අය කල යුතුය. |

(ඇ) කුලී

| | | | | | |
|---|---|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ ආරම්භයට අය වියයුතු බදු කුලී ආදායම රු.7,533,821 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් රු.6,659,850 ක් විය. මේ අනුව වර්ෂය තුළ අයවිය යුතු මුළු ආදායම රු.14,193,671 ක් වුවද, රැස් කළ ආදායම රු.9,887,267 ක් වීමෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට රු.4,306,404 ක හිඟයක් පැවතුණි. | පවත්නා | පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතුකල යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දී ප්‍රාදේශීය සභාව සතු කඩ කාමර 233 කින් කඩ කාමර 189 ක රු.6,344,460 ක මුදලක් හිඟව පැවති අතර, එම හිඟ ශේෂ අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව සභාව කටයුතු කර නොතිබුණි. | නව | පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතුකල යුතුය. |
| (iii) | මහජ්දණ්ඩ පොළ භූමියේ අංක 17 කඩ කාමරය 2018 ජූලි මස සිටම බදු දීමට කටයුතු නොකිරීමෙන් සභාවට රු.83,700 ක ආදායමක් අහිමි වී තිබුණි. | නව | පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ | ටෙන්ඩර් කිරීමට කටයුතුකරන බව. | කඩ කාමර ටෙන්ඩර් කර බදු අය කල යුතුය. |
| (iv) | දංගහවිල සමන් සෙනෙවිරත්න ප්‍රජා කේන්ද්‍රයේ අංක 01 සහ 02 කඩ කාමරවලින් 2013 වර්ෂයට පෙර සිට රු.295,368 ක මුදලක් හිඟව පැවතිය ද, එම හිඟ ශේෂ අයකර ගැනීමට ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර, නැවත එම කඩ කාමර බදු දී තිබුණි. | නව | පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | දීර්ඝකාලීන හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (v) | මහජ්දණ්ඩ පොළ භූමියෙහි කඩ කාමර 31 න් කඩ කාමර 22 ක් සමාලෝචිත වර්ෂයේ වසාදමා පැවති අතර, එම කඩ කාමර වසා තැබීමට හේතු පරීක්ෂා කර, ඊට පිළියම් යෙදීමට හා එම කඩ කාමරවලින් මහජනතාවට අවශ්‍ය සේවාවන් සැපයීමට සභාව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නව | පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ | වසා ඇති කඩකාමර නැවත විවෘත කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව. | කඩ කාමර විවෘත කර මහජනතාව ට සේවා සැපයිය යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (vi) | දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ අංක දපපා/පපාකො/2010/01 දරන චක්‍රලේඛයේ 05 වන වගන්තිය අනුව සෑම ගිවිසුමක්ම වසර 03 කට වරක් යාවත්කාලීන කළයුතු වුවද, සභාව සතු කඩ කාමර 122 ක ගිවිසුම් යාවත්කාලීන කර නොතිබුණි. | නව | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය. | ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කරන බව. | ගිවිසුම් යාවත්කාලීන කල යුතුය. |
| (vii) | දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ අංක දපපා/පපාකො/2010/01 දරන චක්‍රලේඛයේ 06 වන වගන්තිය අනුව වසර 05 කට වරක් තක්සේරු බදු මුදල නව තක්සේරුවක් මගින් සංශෝධනය කළයුතු වුවද, අවසන් වරට තක්සේරුව 2015 වර්ෂයේ සිදුකර තිබූ අතර, සභාව කඩ කාමර 198 ක තක්සේරු ප්‍රතිශෝධනයන් සිදු නොකිරීමෙන් සභාවට ලැබිය යුතු කුලී ආදායම් අහිමි වී තිබුණි. | නව | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය. | තක්සේරු ප්‍රතිශෝධනයන් සිදු කිරිමට තක්සේරු දෙපාර්තමේන්තුව ට යොමු කර ඇති බව. | කඩකාමරව ල වර්තමාන වටිනාකම තක්සේරු කර ආදායම් අයකල යුතුය. |
| **(ඇ)** | **බලපත්‍ර ගාස්තු** | | | | |
| (i) | සභා බල ප්‍රදේශය තුළ පිහිටි ව්‍යාපාර හා වෘත්තීන් සම්බන්ධයෙන් බදු ගෙවිය යුතු ආයතන 14 කින් 2023 වර්ෂයේ දී අයවිය යුතු බදු මුදල් රු.18,460 ක් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | නව | පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ii) | සභා බල ප්‍රදේශය තුළ පිහිටි ව්‍යාපාර හා වෙළඳ බලපත්‍ර ලබා ගතයුතු ආයතන 80 කින් බලපත්‍ර ගාස්තු රු.147,300 ක් අයකර ගැනීමට අදාළ තොරතුරු ලේඛන පරීක්ෂාවේ දී තහවුරු නොවී ය. | නව | පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (iii) | සභා සීමාව තුළ සවිකර ප්‍රදර්ශනය කර තිබූ ප්‍රචාරක දැන්වීම් පුවරු 158 ක් වෙනුවෙන් රු.1,114,950 ක ගාස්තුවක් සමාලෝචිත වර්ෂය තුළ අය කරගෙන නොතිබුණි. | නව | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

(ඉ) **වෙනත් ආදායම්**

| | | | | | |
|---|---|---|---|---|---|
| (i) | සභාව සතු ක්‍රීඩා භූමිය අවස්ථා 05 කදී කිසිදු ආදායමක් අය නොකර පෞද්ගලික පාර්ශවයන්ට නොමිලේ ලබා දීමට සභාව කටයුතු කිරීමෙන් සභාවට රු.9,500 ක ආදායමක් අහිමි වී තිබුණි. | නව | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය. | මෙම වැඩසටහන් සියල්ල සුබ සාධන කටයුතු වන බැවින් නොමිලේ ලබා දීමට කටයුතු කරන ලද බව. | ආදායම් රැස් කිරීම් වර්ධනය කර ගත යුතුය. |
| (ii) | සභාව සතු ජල බවුසරය අවස්ථා 10 කදී පෞද්ගලික පාර්ශවයන් සඳහා සේවයේ යෙදවීමට අදාළව අයවිය යුතු රු.55,000 ක ආදායමක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නව | පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ. | පොදු කටයුතු සඳහා ජල අවශ්‍යතා සපුරා ගැනීමට යොදා ඇති බව. | ආදායම් රැස් කිරීමේ ප්‍රගතිය වර්ධනය කර ගත යුතුය. |

(ඊ) **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| | | | | |
|---|---|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.325,000 ක් හා මුද්දර ගාස්තු රු.9,332,054 ක් විය. | පවත්නා | පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ. | මුද්දර ගාස්තු රු.2,238,138ක් අයවීමට ඇති බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

**ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නව / පවත්නා නිරීක්ෂණයක් ද | පාලන අවදානම් අනාවරණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| සභාව විසින් මාසිකව දිරන කසළ ටොන් 45 පමණ ප්‍රමාණයකුත් නොදිරන කසළ ටොන් 15 පමණ ප්‍රමාණයකුත් සභා සීමාව තුළ එකතු කරනු ලබයි. නොදිරන කසළ මොන්රෝවියාවත්ත කසළ අංගනය වෙත භාර දෙන නමුත්, දිරන කසළ සභාවට අයත් නොවන ඉඩමකට දමා පස් දමා වසා දමනු ලබයි. ඒ අනුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 94 වන වගන්තිය ප්‍රකාරව අපද්‍රව්‍ය සභාව සතු දේපලක් බවට පත්කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නව | පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ. | පොදු මහජනතාවට පීඩාවක් නොවන පරිදි කටයුතු කරන බව. | කසළ කළමනාකරණය සඳහා සුදුසු වැඩපිළිවෙලක් සැකසිය යුතුය. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නව / පවත්නා නිරීක්ෂණයක් ද | පාලන අවදානම් අනාවරණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | යක්කඩුව, ඇල්පිටිය යන ලිපිනයේ පදිංචි අය විසින් වර්ග මීටර් 602 ක තෙමහල් ගොඩනැගිල්ලක් යක්කටුව හන්දියේ ඉදිකර තිබුණි. මෙම ගොඩනැගිල්ල සඳහා නියමිත ගොඩනැගිලි සීමාව තබා නොතිබුණි. | නව | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය. | සැලසුම් කමිටුවට ඉදිරිපත් කිරීමට නියමිත බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | උක්වත්ත යක්කටුව ලිපිනයේ පදිංචි අය විසින් එකී ස්ථානයේ වර්ග මීටර් 233 ක නව ගොඩනැගිල්ලක් අනවසරයෙන් ඉදිකර තිබුණි. මෙම ඉදිකිරීමට අදාළ නියමිත ගොඩනැගිලි සීමාව තබා නොතිබුණි. | නව | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය. | ඉදිරි ක්‍රියාමාර්ග සැලසුම් කමිටුවට යොමු කර ගනු ලබන බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඇ) | සැලසුම් කමිටු තීරණ මඟින් BA/2022/HNT/02 දරන සංවර්ධන බලපත්‍රයට අනුමැතිය ලබා දී තිබුණු අතර මෙම ඉදිකරමින් පවතින ගොඩනැගිල්ලට යාබදව වර්ග මීටර් 421 ක අනවසර ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි. | නව | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය. | නීත්‍යානුකූල කර ගැනීම සඳහා කටයුතු කරන ලෙස දැනුම් දී ඇති බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඈ) | සැලසුම් කමිටු තීරණ මඟින් BA/2023/HNT/02 දරන සංවර්ධන බලපත්‍රයට 2023 මැයි 08 දින අනුමැතිය ලබා දී තිබුණි. ඉදිකරන ලද ගොඩනැගිල්ල සඳහා නියමිත ගොඩනැගිලි සීමා තබා නොතිබුණි. | නව | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය. | ගොඩනැඟිලි සීමාව තුළ පැවති පැරණි ගොඩනැඟිල්ල බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඉ) | කරන්දෙණිය බල ප්‍රදේශය තුළ ඉදිකරන ලද මෙම අනවසර ඉදිකිරීම් 04 සම්බන්ධයෙන් සභාව විසින් නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීම හා ආවරණ අනුමැතිය ලබාදිය හැකි ගොඩනැගිලි සම්බන්ධව රු.2,580,000 ක ගාස්තු අයකර ආවරණ අනුමැතිය ලබා දීමට කටයුතු කර නොතිබුණි. | නව | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය. | එක් ඉදිකිරීමක් සඳහා ආවරණ අනුමැතිය ලබා දීමේ ගාස්තු අයකර ගැනීමට කටයුතු කරන බව හා අනෙකුත් ඉදිකිරීම් තුන සඳහා සැලසුම් අනුමැතිය ලබා දීමෙන් අනතුරුව මෙම ඉදිකිරීම සිදු කර ඇති බැවින් | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |

ආවරණ අනුමැතියක් ලබා දීමේ ගාස්තු අය කිරීමක් අදාල නොවන බව.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නව / පවත්නා නිරීක්ෂණ යක් ද | පාලන අවදානම් අනාවරණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ඌරගස්මංහන්දිය ජල ව්‍යාපෘතියේ ජල පාරිභෝගිකයින්ගෙන් හිඟ ජල ගාස්තු රු.1,148,760 ක් අයකර ගැනීමට සභාව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. මෙම ව්‍යාපෘතියේ ජල මීටර් 139 ක් අක්‍රිය වී පැවති අතර, එම ජල මීටර් අළුතින් සවි කිරීමට කටයුතු නොකිරීම මත රු.8,950 ක ස්ථාවර ආදායමක් පමණක් මාසිකව සභාව උපයාගෙන තිබුණි. | නව | පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ. | හිඟ බිල්පත් මුදලින් 50%ක් අයකර ගත හැකි බවත්,අක්‍රිය ජල මනු නැවත සවි කිරීමට ක්‍රියා කරන බව. | ජල මීටර් ක්‍රියාකාරී තත්ත්වයට පත් කළ යුතු අතර හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2023 ජනවාරි මස සිට අගෝස්තු 31 දින දක්වා ජල බදු බිල් කිරීම් රු.647,540 ක් වූ අතර, ජල ව්‍යාපෘතියේ විදුලි වියදම රු.905,540 ක් වී තිබුණි. ඒ අනුව ජල සේවා සැපයීමෙන් සභා අරමුදලට රු.258,000 ක පාඩුවක් සිදු වී තිබුණි. | නව | පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ. | විදුලි බිල් වැඩිවීමට සමානුපාතිකව ජල බිල් වැඩි නොකල බව. | ආදායම් රැස් කිරීමේ ප්‍රගතිය වර්ධනය කර ගත යුතුය. |
| (ඇ) | සභා බල ප්‍රදේශයේ වීථි පහන් 2200 ක් නඩත්තු කළ ද, වීථි පහන් කණු 1847 ක් අංක කර නොතිබුණු අතර, වීථි පහන් ලේඛනය නිසි පරිදි යාවත්කාලීන කර නොතිබුණි. | නව | පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ. | වීථි පහන් කණු 353 ක් අංක කර ඇති අතර ඉතිරි කණු ප්‍රමාණයද ඉදිරියේදී අංක කිරීමට කටයුතු කරන බව. | වීථි පහන් කණු අංක කර ලේඛනය යාවත්කාලි න කර පවත්වා ගත යුතුය. |
| (ඈ) | ඉඩම් වෙන්දේසි කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර තිබුණු අංක SD/HNT/2023/38 දරන ඉඩම් අනුබෙදුමට අදාළව පැවති ඇල ඉවුරේ සිට ගොඩබිම දෙසට මීටර් 6.5 ක දුර ප්‍රමාණය රක්ෂිත සීමාව ලෙස | නව | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය. | ඉඩමේ යම් ඉදිකිරීමේ කටයුත්තක් සිදු කිරීමේදී නැවත වාර්මාර්ග නිර්දේශ ලබා ගත යුතු බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |

තැබිය යුතු බව දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය සභාව වෙත දැනුම් දී තිබුණු අතර, ඉඩම පිළිබඳ ස්ථානීය පරීක්ෂාවේ දී එසේ රක්ෂිත සීමාවක් නොතිබුණි. උක්ත අනුබෙදුමට අදාළව පැවති පර්චස් 12.25 ක් වූ මාර්ග හා කාණු පද්ධතිය කොන්ක්‍රීට් කර නොතිබූ නමුත්, සභාව විසින් පූර්ව අධීක්ෂණයකින් තොරව අනු බෙදුම් කිරීම සඳහා අනුමැතිය ලබා දී තිබුණි.

## 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නව / පවත්නා නිරීක්ෂණයක් ද | පාලන අවදානම් අනාවරණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | විදුලි තොග ලේඛන ශේෂය හා භෞතික ශේෂය අතර තොග අයිතම 09 ක ඒකක 496 කට අදාළව රු.1,363,723 ක වෙනසක් පැවතුණි. | නව | පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ. | තොග ලේඛනය තුලනය කිරීමෙන් මෙම වෙනස නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ලේඛනයේ ශේෂය හා භෞතික ශේෂය අතර වෙනසක් ඇති නොවීමට කටයුතු කල යුතුය. |
| (ආ) | සභාව සතු අක්කර 01 රූඩ් 03 පර්චස් 21 ක් වූ ඉඩම් 08 ක් හා ප්‍රමාණය ඉදිරිපත් නොකළ ඉඩමක් නිශ්කාර්යව පැවති අතර, මෙම ඉඩම්වල වටිනාකම වෘත්තීය තක්සේරුකරුවෙකු මගින් තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි. | නව | පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ. | තක්සේරු කිරීමෙන් අනතුරුව සුදුසු කටයුතු සඳහා යොදා ගැනීමට කටයුතු කරන බව. | සභාව සතු වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | කුරුඳුගහ හැතැක්ම උප කාර්යාල භූමියේ පිහිටි වර්ග මීටර් 271.44 ක් තරම් වූ ගොඩනැගිල්ලේ තලාද තට්ටුව (slab) ප්‍රාදේශීය සභාව මගින් ඉදිකර තිබුණු අතර, ඒ සඳහා පියගැට පෙලක් ඉදිකර නොතිබුණි. කොන්ක්‍රීට් කණු හා තලාද තට්ටුව ඉදිකිරීමේ දී නියමිත හැඩයම් වැඩ (Form Work) මනාව නිම කර නොමැති බැවින් හොඳ නිමාවක් නොතිබුණි. පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දිස්ත්‍රික් ඉංජිනේරුගේ (වැ.බ.) අංක | නව | පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ. | ප්‍රධාන ඉංජිනේරුතුමා වෙතින් උපදෙස් ලබා ගෙන ඉදිරි කටයුතු කරන බව. | සභාව සතු වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කල යුතුය. |

පපාකො/ගා/සං/01/01/15/2021 හා 2021.10.15 දිනැති ලිපිය මගින් දක්වා තිබූ පරිදි මෙම ඉදිකිරීමට අදාළව අත්තිවාරම් විස්තර, කම්බි හා ඉදිකිරීමට අදාළ සැලසුම් ආදිය පිළිබඳ තොරතුරු නොමැති බැවින් උඩුමහල සකස් කිරීම පිළිබඳ තීරණය කිරීමට නොහැකිව තිබුණි. වටිනාකම හඳුනාගත නොහැකි 2001 වර්ෂයේ දී ඉදිකර තිබුණු මෙම ගොඩනැගිල්ල වසර 20 ට අධික කාලයක් පරිසරයට නිරාවරණය වී තිබීම නිසා තලාද තට්ටුව (slab) තෙතමනයට ලක් වී කොන්ක්‍රීට් දුර්වල වීමේ අවධානමක් පැවති අතර, වසර 20 ට අධික කාලයක සිට අඩක් නිමකර ඇති මෙම ගොඩනැගිල්ල නිෂ්කාර්යව පැවතුණි.

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නව / පවත්නා නිරීක්ෂණයක් ද | පාලන අවදානම් අනාවරණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | කර්මාන්ත 04 ට අදාළ ABC අතුරා සණවත් කිරීම සඳහා පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් හඳුන්වා දී තිබුණු M1 – 013A මිල අනුපාතය භාවිතා කර තිබුණි. මෙම මිල අනුපාතය යටතේ පළල මීටර් 1.2 ට අඩු තීරු වශයෙන් (Strips) ABC අතුරා සණවත් කිරීම කළ යුතු වුවද, එසේ තීරු වශයෙන් සිදුකර නොතිබුණි. පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් හඳුන්වා දී තිබුණු තීරු වශයෙන් (Strips) ABC ඇතිරීම අවශ්‍ය නොවන M1 – 012A සණ මීටරයට රු.805 මිල අනුපාතය භාවිතා නොකිරීම නිසා සණ මීටර් 35.83 ක් සඳහා රු.12,264 ක් වැඩිපුර ගෙවා තිබුණි. | නව | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය. | අදාල සමිති වලින් අයකර ගැනීමට කටයුතු කරන බව. | නියමිත මිල අනුපාත භාවිතා කල යුතුයි. |

### 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නව / පවත්නා නිරීක්ෂණයක් ද | පාලන අවදානම් අනාවරණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| **(අ) සේවක පුරප්පාඩුව හා අතිරික්තතා** | | | | |
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට ඖෂධ සංයෝජක, විදුලි කාර්මික, ආදාහනාගාර ක්‍රියාකරු, ආදාහනාගාර සහය ක්‍රියාකරු හා වැඩ ක්ෂේත්‍ර කම්කරු ඇතුළු වැදගත් සේවක පුරප්පාඩු 24 ක් පැවති අතර, ද්විතීයික කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 04 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි. | පවත්නා | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය. | ඉදිරියේදී පුරප්පාඩු සපුරා ගැනිමට කටයුතු කරන බව. | අතිරික්තතා විධිමත්කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ආ) සේවක ණය** | | | | |
| වසර 09 ත් වසර 35 ත් අතර කාලයක සිට පැවත එන සේවක ණය ශේෂය රු.166,140 ක් විය. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv වැනි පරිච්ඡේදයේ 12.10 වගන්තිය ප්‍රකාරව කටයුතු කර හිඟ ණය මුදල් අයකර ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි. | පවත්නා | පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ. | අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| **(ඇ) නිලධාරීන් සේවයේ යෙදවීම** | | | | |
| සභාවේ සේවය කරනු ලබන ස්ථිර සේවකයන් 06 ක් හා අනියම් / ආදේශක සේවකයන් 03 ක් තම නියමිත රාජකාරියෙන් බැහැරව වෙනත් රාජකාරීන් ඉටු කර තිබුණි. | නව | පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ. | රාජකාරී අවශ්‍යතාවය මත රාජකාරී පැවරූ බව. | අවශ්‍යතාවය අනුව නිත්‍ය තනතුරේ රාජකාරී සඳහා අනුයුක්ත කල යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 ගිණුම් ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | නව / පවත්නා නිරීක්ෂණ යක් ද | පාලන අවදානම් අනාවරණය | කළමනාකාරීත්ව යේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන රීති) පී.එස්.17 (161 වන රීතිය) ප්‍රකාරව ආදායම් හා වියදම් ගිණුම (මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | නව | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය. | ඉදිරිපත් කර ඇති බව. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |

### 4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නව / පවත්නා නිරීක්ෂණ යක් ද | පාලන අවදානම් අනාවරණය | කළමනාකාරීත්ව යේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| වාර්ෂික අයවැය අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් 2023 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර අනුමත කර තිබුණ ද, ඇස්තමේන්තු වටිනාකම වන රු.950,000 ක් වන වැඩ යෝජනාවක් පමණක් සිදුකර තිබූ අතර, රු.18,086,704 ක් වූ වැඩ යෝජනා 10 ක් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | නව | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය. | සභා අරමුදල් දූර්වල තත්ත්වයක පැවති බව. | ක්‍රියාකාරී සැලැස්ම අනුව කටයුතු කල යුතුය. |

### 4.3 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නව / පවත්නා නිරීක්ෂ ණයක් ද | පාලන අවදානම් අනාවරණය | කළමනාකාරීත්ව යේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 විධිවිධාන හා පළාත් පාලන කොමසාරිස් (ද.ප) ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපප/යහ/01/නා.ව.ලෙ. දරන චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර | පවත්නා | පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ. | විගණන සැලැස්මට අනුව අභ්‍යන්තර විගණන කටයුතු සිදු කරන බව. | චක්‍රලේඛය පරිදි කටයුතු කල යුතුය. |

විගණනයක් සිදුකල යුතු වුවද, අභ්‍යන්තර විගණන නිලධාරියකු පත් කර තිබුණ ද, අභ්‍යන්තර විගණන රාජකාරි නිසි ලෙස ඉටු වී නොතිබුණි. එමෙන්ම වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කර ඊට අනුකූල වන පරිදි අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට ද කටයුතු කර නොතිබුණි.

### 4.4 අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණය | නව / පවත්නා නිරීක්ෂණයක් ද | පාලන අවදානම් අනාවරණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ආදායම් විෂයයන් 02 ක රු.2,651,191 ක හිතකර විචලනයක් දක්නට ලැබුණ අතර, එම වටිනාකම සියයට 14 ත් සියයට 62 ත් අතර පරාසයක විය. | පවත්නා | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය. | පිළිතුරු ඉදිරිපත් කර නැත. | විචලනයන් අවම වන පරිදි කටයුතු කල යුතුය. |
| (ආ) | වියදම් විෂයයන් 07 ක එකතුව රු.29,292,627 ක් වූ ඉතිරිවීම් දක්නට ලැබුණු අතර, එම අගයන් සියයට 07 ත් සියයට 77 ත් අතර පරාසයක විය. | පවත්නා | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය. | පිළිතුරු ඉදිරිපත් කර නැත. | විචලනයන් අවම වන පරිදි කටයුතු කල යුතුය. |
| (ඇ) | ආදායම් විෂයයන් 05 ක ළඟාකර නොගත් ඉලක්කගත ආදායම්වල එකතුව රු.37,794,502 ක් වූ අතර, එම වටිනාකම සියයට 06 සිට සියයට 67 දක්වා පරාසයක විය. | පවත්නා | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය. | පිළිතුරු ඉදිරිපත් කර නැත. | විචලනයන් අවම වන පරිදි කටයුතු කල යුතුය. |

යූ.යූ.පී. පෙරේරා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

යූ. යූ. පී. පෙරේරා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය